සබරගමුව පළාත් සභාව
சபரகமுவ மாகாண சபை
SABARAGAMUWA PROVINCIAL COUNCIL

*2016 ඔක්තෝබර් මස 25 අඟහරුවාදා දින*
*2016 ஒக்டோபர் மாதம் 25 ஆம் திகதி செவ்வாய்க்கிழமை*
***Tuesday 25 th October 2016***

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
----------------------------------------------------------

සියළුදෙනාටම සුභ උදෑසනක්, සුභ දවසක් ප්‍රාර්ථනා කරනවා මුලින්ම. සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා, ඒ වගේම අමාත්‍ය මණ්ඩලය, ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා, ඒ වගේම සභානායකතුමා, ඒ වගේම විපක්ෂනායකතුමා, විපක්ෂයේ සංවිධායකතුමා, ඒ වගේම මන්ත්‍රීතුමිය ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. මේ වෙලාවේ සබරගමුව පළාත් සභාවේ 2016 ඔක්තෝබර් මස 25 වැනි අඟහරුවාදා දින පවත්වන රැස්වීමේ න්‍යාය පත්‍රානුකූලව ,

**අභිනව මන්ත්‍රීතුමන්ලාගේ දිවුරුම් දීම : නැත**

**ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ : නැත**

**ගරු සභාපතිතුමාගේ නිවේදන :**

සබරගමුව පළාත් සභා කාර්යය පටිපාටි රීති අංක 65.1 යටතේ කරනු ලබන ප්‍රකාශයයි. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (ඌ) 3 අනු ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන කෙටුම්පත පිළිබඳව දින 14 ක් ඇතුළත සබරගමුව පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශයන් එවන ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරවර ජනාධිපති නීතීඥ මාෂල් පෙරේරා මැතිතුමා වෙත 2016 සැප්තැම්බර් මස 16 වෙනි දින දන්වා එවා ඇති කෙටුම්පත මේ අවස්ථාවේ සභාවට ඉදිරිපත් කරලා තියනවා. ඒ සම්බන්ධව දැනුම් දීලා තියනවා. ඒ සම්බන්ධව සභාවේ අනුමැතිය සහ අදහස් සම්බන්ධවයි කථා කරන්න තියෙන්නේ. මේ අවස්ථාවේ ප්‍රධාන ඇමතිතුමාට ආරාධනා කරනවා ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන හැටියට.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*
------------------------------------------

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අගෝස්තු 12 වෙනි දින ප්‍රකාශිත ඒ අතිරේකය අනුව ශ්‍රී ලංකා තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ද, තිරසාර සංවර්ධන සභාවක් පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ සහ අනුශාංගික කරුණු

සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස වූ කෙටුම්පත අනුමත කර යවන ලෙස අප වෙත එවා තිබෙනවා. විශේෂයෙන් මේ සම්බන්ධයෙන් ප්‍රමාදයක් සිද්ධ වෙලා තියනවා කියලා ගරු ආණ්ඩුකාරතුමා පසුගිය සතියෙත් මගෙන් විමසීමක් කළා. අනෙකුත් පළාත් සභා අටම අනුමත කරලා මෙම පනත යවා ඇති බවටත්, පාර්ලිමේන්තුවෙන් දැන්වූවා කියලා. ඒ නිසා මෙම ගරු සභාව මෙම පනත අනුමත කර දෙන ලෙස විශේෂයෙන්ම මම මේ අවස්ථාවේ දී ගරු සභාපතිතුමනි, ඉල්ලීමක් කරනවා.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
---------------------------------------------------------

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙන් තිරසාර සංවර්ධනය සඳහා 2017 සිට අපේ රජය මෙම වැඩ පිළිවෙල දියත් කරලා තියනවා. ඒ දියත් කිරීම සඳහා ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන ජාතික ප්‍රතිපත්තියක් හැටියට තියන එකේ දී විශේෂයෙන්ම පළාත් සභාවේ අනුමැතියක් ඉල්ලනකොට රජයේ බලාපොරොත්තුව රටේ දියුණුව සඳහා යන වැඩ පිළිවෙලට අපේ අනුමැතිය දීමයි.

ඒ නිසා අපේ ප්‍රධාන ඇමතිතුමා යෝජනාවක් කළා සභාවේ අනුමැතිය ලබාදෙන්න කියලා. මම ඔබතුමාට කියන්න කැමතියි අපේ විපක්ෂයේ හැම මන්ත්‍රීවරයෙක්ම මේ යෝජනාවට අනුමැතිය ලබාදෙනවා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
--------------------------------------------------------

බොහොම ස්තුතියි ! ප්‍රධාන ඇමතිතුමාටත්, විපක්ෂනායකතුමාටත්. මේ සම්බන්ධයෙන් න්‍යාය පත්‍රයේ පොදු කටයුතු අවස්ථාවේ අරගෙන සම්මත කිරීම සඳහා කල් තියනවා.

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.
ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න මැතිතුමා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
--------------------------------------------------------

එතුමන්ලා සඳහා නිවාඩු අනුමත වෙනවා මේ වෙලාවේ.

**ලිපි ලේඛණ පිළිගැන්වීම :**

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
--------------------------------------------------------

ගරු මන්ත්‍රී ආරියවංශ බාලසූරිය මැතිතුමා විසින් සභාගත කරන ලද

ඇඹිලිපිටිය කඳුරුගස්ආර හන්දියේ සිට කඩදාසි කම්හල දක්වා කච්චිගල, තෝරගල මාර්ගය සංවර්ධනය කිරීම යන ලිපිය එවලා තියනවා සභාවට.

***ගරු මන්ත්‍රී බී.ආරියවංශ***
***கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ***
*Hon.Member B.Ariyawansha*
---------------------------------------------

සභාපතිතුමනි, පිළිතුරු ලැබුනේ නෑ තවම. ගිය සභාවේ මම යෝජනා කළේ.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------

පිළිතුරු ලැබිලා තියනවා. එම ලිපිය ලැබෙන්න සළස්වනවා.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම : නැත**

**පෙත්සම් : නැත**

**ප්‍රශ්න : නැත**

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යතුමන්ලාගේ ප්‍රකාශ : නැත**

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් :**

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------

නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි, පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ මට විශේෂයෙන් ප්‍රකාශ කරන්න තියෙන්නේ එල්ලාවල, පහළකන්ද ප්‍රදේශයේ මම ජීවත් වෙන ප්‍රදේශය. ගරු සභාපතිතුමනි, මේ ප්‍රදේශයේ ගර්භනී මාතාවන්ට සහ දරුවන්ට නොමිළේ සායන මධ්‍යස්ථානවලින් ලබාදෙන ත්‍රිපෝෂ සහනාධාරය මාස 6 කින් ලැබිලා නෑ. ඉතින් ඒක නිසා මේක සාමාන්‍ය දුප්පත් පවුල්වල දරුවන්ට බලපාන ප්‍රශ්නයක්. මගේ ඥාතිවරුන්ගේ සහෝදරියන් ගිය අවස්ථාවල දී මට කථා කරලා කිව්වා දැන් අපි අවස්ථා ගණනාවක බැලුවා, ත්‍රිපෝෂ නෑ කියලා. ඉතින් ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ මේ දුප්පත් පවුල්වල දරුවන්ටවත්, මේ අඩු බර සහිතව ඉන්න අයගේ පෝෂණය සඳහා ලබාදෙන ත්‍රිපෝෂ සහනාධාරය පහළකන්ද සායන මධ්‍යස්ථානය, මාටුවාගල, මේ වගේ සායන මධ්‍යස්ථානවලට මාස 6 කින් දීලා නෑ. ඉතින් ඒ නිසා මේක පිළිබඳව බලලා හැකි ඉක්මණින් කටයුතු කරන්න ඕන කියන කාරණාව කියනවා. ඒ වගේම මට දැන

ගන්න ලැබුණු හිතවතෙකුගේ මාර්ගයෙන් ත්‍රිපෝෂ සහනාධාරය ඉදිරියේ දී කප්පාදු කරනවා කියලා.

ඒ වගේම ත්‍රිපෝෂ ලබාගන්න ඕන අයට කඩෙන් ලබාගන්න, එහෙම නැත්නම් සතොස මඟින් ලබාදෙන ක්‍රමවේදයකට මේ අලුත් ආණ්ඩුව හරහා ක්‍රියා මාර්ගයක් ගන්න කෙරෙන බව කතිකාවක් කෙරෙන බවට අපට තොරතුරු ලැබිලා තියනවා.

ඉතින් ඒ නිසා මෙච්චර කාලයකට අපි පුංචි කාලයේ ඉඳලා අපට මේ ලැබුණු සහනාධාර ටිකෙන් ටික කප්පාදු වෙමින් යන බව තමයි පේන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ කථා කළේ මගේ ප්‍රදේශයේ, අපේ හිතවතුන්ගේ, අපේ ආදරණීය දූවා දරුවන්ගේ මේ ලැබුණු සහනාධාරය කප්පාදු කිරීම පිළිබඳව අපගේ බලවත් විරෝධය සහ ඉදිරියේ දී මෙවැනි සහනාධාර කපා හරින්නේ නම් ඊට විරෝධය පළ කිරීමක් හැටියට මම මේ අවස්ථාවේ දී මේක සභාවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම සභාපතිතුමනි, ඒ යටතේම කථා කරන්න අවශ්‍යයි. දැන් ලබන මාසය වෙනකොට අපේ අයවැය අවස්ථාව එනවා. අයවැය අවස්ථාවේ දී ඉතිහාසයේ මතකයි ආණ්ඩු පක්ෂය හැටියට අපි විපක්ෂය එක පාරක් අපේ කතා හරහා අපට විරෝධය පළ කරලා විපක්ෂය එක පාරක් සභා ගැබෙන් ගිහිල්ලා අපි ආණ්ඩු පක්ෂය හැටියට එක පාරක් අයවැය සම්මත කළා. හැබැයි මේ අවස්ථාවේ දී මම විශේෂයෙන් පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ කථා කරන්නේ. මෙවර අයවැය තුළදීත් ඊට සමගාමීව වෙනස් ආකාරයට අයවැය අවස්ථාවේ දී යම් ආකාරයේ අපට ගැටළු සහගත තත්ත්වයන් තිබෙන බව මතක් කර සිටිමින් ඒවා ඒ අයවැය අවස්ථාවේ දී ඒ ආන්දෝලනාත්මක කටයුත්ත අපි කරන්නට සූදානමින්, කථාබහකින් යුතුව සිටින බවත් මාගේ පෞද්ගලික ප්‍රකාශ කිරීම් අවස්ථාවේ දී අද මේ සභාවට ඉදිරිපත් කර සිටිනවා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

----------------------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා කියපු විදිහට ඇහැළියගොඩ ආසනය ගත්තොත් ත්‍රිපෝෂ කැපීමට දේශපාලඥයෙකුගේ උවමනාවට කරනවා කියලා. මේක නම කියන්න කියලා කියන්න ඕන. මොකද එහෙම නැත්නම් මේක ලොකු ප්‍රශ්නයක්. එහෙම එක එක්කෙනාට ඕන ඕන ආකාරයට අහිංසක ජනතාවට දෙන ආධාර කැපීමක් වෙලා නෑ. ඒ නිසා තමුන්නාන්සේ එහෙම නම් දේශපාලඥයාගේ නම කියන්න ඕන. මේක හැමෝටම මඩ ගහන්න බෑ, එහෙම.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*

----------------------------------------------------------

පහළකන්ද සායන මධ්‍යස්ථානයේ මාස 6 කින් ත්‍රිපෝෂ දීලා නෑ.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
------------------------------------------------------

දීලා නැත්තේ නෑ. අඩුපාඩුවක් ඇති. අඩුපාඩුව අපි හදාගනිමු. ඒක වෙනම දෙයක්. නමුත් මේ දේශපාලඥයෙකුගේ උවමනාවට ත්‍රිපෝෂ කපා දාලා තියනවා කියන එක මේක සහගහන අපරාධයක්.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*
------------------------------------------------------

යහ පාලන ආණ්ඩුවෙන් මාස 6 ක දීලා නෑ.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
------------------------------------------------------

අපි කපලත් නෑ. අපි කපන්න කියලත් නෑ. දේශපාලඥයෙක් කිව්වාම ඒ නම කියන්න කරුණාකරලා.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*
------------------------------------------------------

රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුවෙන් කපලා තියෙන්නේ. ඔබතුමා නෙමෙයි. ඔබතුමා ඇහැළියගොඩ ආසනයේ සංවිධායකතුමා. ඔබතුමාට කරන්න දෙයක් නෑ ඒකට. මේක කපලා තියෙන්නේ වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුවෙන්.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
------------------------------------------------------

අපේ ආණ්ඩුවෙන් සහනාධාර කපලා නෑ. වැඩියෙන් දීලා තියනවා. මම දැනුවත්ව කියන්නේ. කවුද දේශපාලඥයා කියන්න ?

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*
------------------------------------------------------

රනිල් වික්‍රමසිංහ.

**(සභාවෙන් සෝෂා)**

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
------------------------------------------------------

අපේ නායකතුමා ආධාර කපන කෙනෙක් නෙමෙයි. එහෙම කතන්දර කියන්න එපා.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*
------------------------------------------------------------

ඔබතුමා කරුණාකරලා වරද්දා ගන්න එපා. ඔබතුමාට නෙමෙයි කිව්වේ. ඔබතුමාට චෝදනා කරනවා නෙමෙයි. කරුණාකරලා එහෙම දෙයක් මා අතින් කියවුනා නම් සමාවෙන්න. ඔබතුමාට කිව්වේ නෑ. හැබැයි ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් ත්‍රිපෝෂ සහනාධාරය කප්පාදු කරලා තියනවා. මාස හයකින් ත්‍රිපෝෂ ලැබිලා නෑ. පහළ කන්ද සායන මධ්‍යස්ථානයට මාස හයකින් ත්‍රිපෝෂ නෑ. ඒකට සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාට කරන්න දෙයක් නෑ.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
------------------------------------------------------

අපි අවශ්‍ය අය දැනුවත් කරනවා.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*
------------------------------------------------------------

දැනුවත් කරන්න තමයි කිව්වේ. ඔබතුමා අද ගිහිල්ලා කරුණාකරලා හොයලා බලන්න. මම කියපු කථාවක් නෙමෙයි. ඔබතුමන්ලාගේ ආණ්ඩුවට චෝදනාව.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

සභාව නිශ්ශබ්ද වෙන්න. රංජිත් බණ්ඩාර ඇමතිතුමාට අවස්ථාව.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*
------------------------------------------------------

සභාපතිතුමනි, ත්‍රිපෝෂ බෙදා දීම දෙයාකාරයකින් සිද්ධ වෙනවා. එකක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වෙනවා. එකක් මගේ අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක වෙනවා. පරිවාස හා ළමාරක්ෂක එකෙන්. අපි ත්‍රිපෝෂ ලබාදෙන්නේ පෙර පාසල් සඳහා පමණයි. ඒ නිසා මේක කවුරුවත් වරදවා වටහා ගන්න එපා. පරිවාස හා ළමාරක්ෂන දෙපාර්තමේන්තුවෙන් අපි බෙදන්නේ පෙර පාසල් සඳහා පමණයි. ඒ නිසා මෙතන සායන කියලා මතු කරපු නිසා ඒක මම හිතන්නේ සෞඛ්‍ය පැත්තට තමයි යන්නේ. මම දන්නේ නෑ ඒක සම්බන්ධයෙන් සෞඛ්‍ය ඇමතිතුමාගෙන් තමයි විමසන්න වෙන්නේ.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*
------------------------------------------------------------

සභාපතිතුමනි, මට අවස්ථාවක් දෙන්න. මොකද මේ ආණ්ඩුව ගැන විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමා කථා

කළා. රනිල් වික්‍රමසිංහ මහත්මයා මේක කරලා තියෙන්නේ කියලත් කථා කළා. මෙතනදී පැහැදිලිවම කියන්න ඕන මේ ත්‍රිපෝෂ ලබාදීමේ කටයුතු, සහනාධාර දෙන දේවල් රජය විසින් තවම කපා හැරලා නෑ. කිසිම අවස්ථාවක කොයි දෙයකටවත් ඇඟිල්ලක් තියලා නෑ. මේ රජය ගත්තාම විශේෂයෙන්ම සමෘද්ධිලාභීන්ට ලැබිය යුතු ප්‍රමාණය දෙගුණයක් කරලා දුන්න රජයක් මේක. ඒ වගේම ගැබිනි මව්වරුන්ට සහනාධාර පෙර තිබුනේ නෑ. මේ වෙනකොට යම් ප්‍රමාණයකට ගැබිනි මව්වරුන්ට සහනාධාර දෙන්න කටයුතු කරලා තියනවා. අපි කණගාටු වෙනවා නිකම් හරි මේ සහනාධාර කපා හැරියා කියලා මහා ලොකුවට කථා කරන එක ගැන අපේ කණගාටුව ප්‍රකාශ කරනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

-----------------------------------------------------------

ඉඳුනිල් ශාන්ත මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී ඉඳුනිල් ශාන්ත ගුණසේන***
***கௌரவ உறுப்பினர் இதுனில் ஷாந்த குணசேன***
*Hon.Member Indunil Shantha Gunasena*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම පසුගිය දිනක උස්සාපිටියේ අර නායයෑමෙන් අවතැන් වෙච්ච ඒ සහෝදර ජනතාව ඉන්න ඒ කූඩාරම් ඉදිකරලා තියන ස්ථානයට ගියා. ගිහිල්ලා ඒ කට්ටියත් එක්ක සාකච්ඡා කළාම අඩුපාඩු කීපයක් තිබ්බා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට දුරකථනයෙන් කථා කරලා කිව්වා. ඒ වෙලාවේ ඒ ටික කරලා දුන්නා. එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, ඒ කූඩාරම්වල ඉඳලා ශිෂ්‍යත්ව විභාගය ලියපු දරුවෙක් ඒ දරුවාගේ තාත්තාත් නෑ. අම්මා රෝගීව ඉන්නේ. මාස පහක් තිස්සේ ඒ කූඩාරම්වල හිටියේ. ඒ දරුවා ශිෂ්‍යත්ව විභාගය ලියලා සමත් වෙලා තියනවා. ඉතාම අසරණ තත්ත්වයේ ළමයෙක්. පාඩම් කරන්න ලයිට් එකක්වත් නෑ කූඩාරම තුළ. ඉතින් ඒ දරුවාට තවම නිවාසයක් එහෙම හම්බවෙලත් නෑ. ආධාර අරවා මේවා මොකුත් නෑ. ලඟදී හම්බ වෙයි කියලා බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ දරුවාට විශේෂයක් කරලා මේ පළාත් සභාවෙන්, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විශේෂ ආධාරයක් ඒ දරුවාට කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරන්න තමයි මම කාලය ඉල්ලා ගත්තේ. ඒ නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙත්, ප්‍රධාන ඇමතිතුමාගෙත් අවධානය යොමු කරලා ඒ දරුවාට විශේෂ ආධාර මුදලක් ලබාදෙන්න කටයුතු කරන්න කියලා ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි !

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

-----------------------------------------------------------

බොහොම ස්තුතියි ! අපේ ඉඳුනිල් ගරු මන්ත්‍රීතුමාට. මීළඟට කරුණාපාල ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***

*Hon.Member G.M.Karunapala*
----------------------------------------

ගරු සභාපතිතුමනි, මට බලපාන පෞද්ගලික ප්‍රශ්නයක් මෙන්ම සමස්ත රටේ සියළුදෙනාටම බලපාන ප්‍රශ්නයක්. වත්මන් ආණ්ඩුව මේ රටේ වැඩිම වැය ශීර්ෂයක් වෙන් කළයුතු කරුණු දෙකට මුදල් කප්පාදු කරලා තියනවා. අපි නැවත අතීතයේ අවුරුදු 30 කට, 40 කට යනවාද ? නැත්නම් අනාගතයට ඉක්මණින් යනවාද ? කියන ප්‍රශ්නයක් තියනවා. මේ සමස්ත රටේ ජනයා රැකෙන්නේ අධ්‍යාපනය මත. පහුගිය රජය හා නිදහසින් පසු බිහිවුන සෑම රජයක්ම වැඩිම මුදලක් වෙන් කළේ අධ්‍යාපනයට. නමුත් වත්මන් ආණ්ඩුව මේ අධ්‍යාපනයේ වැය ශීර්ෂය මිලියන ගාණක් කපා හැරලා, විශ්ව විද්‍යාලයට යන ප්‍රමාණය අඩු කරලා, ශිෂ්‍යත්වලාභී ප්‍රමාණය අඩු කරලා, අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ප්‍රමාණය අඩු කරලා ඉතාමත් සූක්ෂම විදිහට අධ්‍යාපන කප්පාදුවකට යනවා. ඒක ඉතා පැහැදිලි වුනේ පහුගිය දවසක මුදල් ඇමතිතුමාගේ ප්‍රකාශනයෙන් අමාත්‍යාංශයට මෙන්න ගිය වසරේ මෙච්චර වෙන් කළාය. ඊට ඉස්සෙල්ලා වසරවල මෙච්චර වෙන් කළාය. මේ වසරේ මිලියන හයයි දශම ගාණක් අඩු කළාය කියන ප්‍රකාශනය. සංඛ්‍යාව වරදින්න පුළුවන්. ඒ ගැන විවාද කරන්නත් එපා. ඊළඟට ඒ සමඟම යන්නේ අපි දන්නවා මේ වත්මන් දැන් මේක සහජීවන කේම්බ්‍රිජ් ආණ්ඩුවකුත් නෙමෙයි. එකිනෙකා තම තමාගේ බලය තහවුරු කිරීමට යැම කරන්නේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, ආණ්ඩුවත්.

එහෙම තියෙද්දී මේ රටේ අවශ්‍යම අනෙක් කරුණ තමයි සෞඛ්‍යය.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------

මේ පෞද්ගලික ප්‍රශ්නයක්ද ?

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*
----------------------------------------

මට බලපාන පෞද්ගලික ප්‍රශ්නයක්. කාටවත් ප්‍රශ්නයක් නැහැනේ. මගේ දරුවෝ ඉඟන ගන්නවා. මේ අධ්‍යාපනය මේ රටට.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
---------------------------------------

අපට උත්තර දෙන්න අවස්ථාවක් ඕනෑ ගරු සභාපතිතුමනි.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*
----------------------------------------

ඕනෑ තරම් උත්තර දෙන්න. මේක මාධ්‍යයෙන් කියපු, රවී කරුණානායක මුදල් ඇමතිතුමා කියපු කරුණු මේවා.

හැබැයි ගරු සභාපතිතුමනි, උත්තර බැන්දොත් අපිත් නැවත උත්තර බදිනවා.

මේ අපට බලපාන ප්‍රශ්නයක් මේක. මේකට තමුන්නාන්සේලාට වුනත් කට වහගෙන ඉන්න බෑ, ආණ්ඩුවේ හිටියා කියලා.

(සභාවෙන් සෝෂා)

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*
----------------------------------------

උත්තර කිව්වොත් අපිත් උත්තර බදින්න සූදානම්. ඊළඟට ඉතාම වැදගත් කරුණක් තමයි සෞඛ්‍ය. මේ ඊයේ පෙරෙයිදා ආණ්ඩුව ගෙනාවා දුම්කොල බද්දක්. සිගරට් මිළ වැඩි වුනා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------

කෙටියෙන් අදහස පමණක් ඉදිරිපත් කරලා අවසන් කරන්න.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*
----------------------------------------

ගරු සභාපතිතුමනි, විපක්ෂනායකතුමනි, පොදු මහත් කථාවක් මේක. මේක පෞද්ගලික ප්‍රශ්නයක්. අපේ ළමයින්ට ශිෂ්‍යත්ව අරමුදල දෙන්නේ නැත්නම්, අපේ අධ්‍යාපනය පාසල් ටික හැදෙන්නේ නැත්නම් මේක පෞද්ගලිකයි අපට. අපේ දරුවෝ ඉගන ගන්නවා. ඇතැම් අයගේ දරුවෝ අධ්‍යාපනය නොකළාට අපට කරන්න දෙයකුත් නෑ. මට කරන්න දෙයක් නෑ. මම ඇත්ත කථා කරන්නේ. ඒක හින්දා මට කථා කරන්න ඉඩ දෙන්න. අධ්‍යාපනයේ වැය ශීර්ෂ කපා හැරීම. ගරු මන්ත්‍රීතුමනි, කේන්ති ගන්න එපා. මේ ඔක්කෝටම බලපානවා මේවා. මේ අධ්‍යාපනය වර්ධනය නොවුනොත් එහෙම නූගත් පරපුරක් බිහි වෙනවා.

(සභාවෙන් බාධා)

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------

කරුණාපාල මන්ත්‍රීතුමා, ඔබතුමා වෙනම යෝජනාවක් සභාවට ඉදිරිපත් කරන්න.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*
----------------------------------------

අද මොකවත් නෑ, න්‍යාය පත්‍රයේ. ඒ නිසා මේවා හරි කථා කරන්න ඕන.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉල්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***

*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

ඒකාබද්ධ ආණ්ඩුවක් තියෙන්නේ.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*
----------------------------------------

ඒකාබද්ධ හරි මොකක් හරි. සෝමදාස විපක්ෂනායකතුමනි, තමුන්නාන්සේටත් බලපානවා. සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාටත් බලපානවා.

(සභාවෙන් සෝෂා)

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
--------------------------------------------------------

කරුණාපාල ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා න්‍යාය පත්‍රයේ සභාව කල් තියන අවස්ථාවේ යෝජනා යටතේ අවස්ථාව ගන්න.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*
----------------------------------------

සමස්ත රටේම පළාත් සභා මේ සම්බන්ධයෙන් විරුද්ධ වියයුතුයි කියලා මම යෝජනා කරනවා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

ගරු සභාපතිතුමනි, කරුණාපාල ගරු මන්ත්‍රීතුමා විසින් කියන ලද සහ මේක න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා ගෙනාවොත් අපි සාකච්ඡා කරන්න සූදානම්. ඒ වගේම තමයි එතුමා පැහැදිලිවම කිව්වා අධ්‍යාපනය, සෞඛ්‍ය ගැන. මේ සියල්ලටම වර්තමාන රජය, යහපාලන රජය ඉතාමත්ම හොඳින් යහපත් විදිහට අනාගතය සාර්ථක කරගන්න මේ වෙනකොට විසර්ජනය පාර්ලිමේන්තුවට ගෙනල්ලා තියනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
--------------------------------------------------------

ඉෆ්ලාර් මන්ත්‍රීතුමා........

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***

*Hon.Member M.Y.M.Iflar*
---------------------------------------

මෙතුමා කියපු ඒවාට උත්තර දෙන්න ඕන.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------

එතුමා කියපු ඒවා වැරදි නම් ඔබතුමාත් වැරදියිනේ.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
---------------------------------------

මේවාට උත්තර දෙන්න අපි ලෑස්තියි.

**(සභාවෙන් සෝෂා)**

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------

එතුමා වැරදි වැඩේ කළා නම් ඔබතුමාත් ඒක කරන්න එපා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
---------------------------------------

නිහඬව හිටියොත් ජනතාව හිතන්නේ ඒක තමයි සත්‍ය කියලා. අපි කරුණු පැහැදිලි කරන්න ඕන. අපි ලෑස්තියි උත්තර දෙන්න. එතුමාට අවස්ථාව දුන්නා නම් අපටත් අවස්ථාව දෙන්න. ඔබතුමා කියනවා නම් මම වාඩිවෙන්න ලෑස්තියි. හැබැයි හොඳට මතක තියාගන්න යහපාලන රජයේ අනාගතයේ ගේන අයවැය ජනතාවට යහපත් විදිහටයි ගේන්නේ. මේක ඉතාම පැහැදිලිව පක්ෂ දෙකම ඒකාබද්ධ වෙච්ච ඉතාම වැදගත් අවස්ථාවක්. කවුරු හරි ඇවිල්ලා කියන්න පුළුවන් විවිධ කතන්දර. අනෙක් එක මේ කියන සියල්ලම මතක තියාගන්න ඕන තමුන්නාසේලා අයවැයේ දී සිහිනයක් වෙච්ච සියල්ල බොඳ වෙලා යන්න පුළුවන්. ඒ බොඳ වෙන සිහිනයට තවමත් කල් බල බලා ඉන්න පුළුවන්. අද කියයි හෙට කියලා. තමුන්නාන්සේලා ඒකාබද්ධ න්‍යාය පත්‍රය මෙතනට ගෙනල්ලා මෙහෙම කථා කරන්න දෙන්න බෑ.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. ඒ පැත්තේ කරුණාපාල මන්ත්‍රීතුමා වැරදි නම් ආපහු ඔබතුමාත් වැරැද්දක්නේ කියන්නේ.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***

*Hon.Chief Minister Mahipala Herath*
--------------------------------------------

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා අපට අපේ පළාත සම්බන්ධ අපට ඉතාමත් වැදගත් ප්‍රශ්න ගණනාවක් අපි සාකච්ඡා කර ගැනීම සඳහා දෙපාර්ශවයම බොහොම සමගි සම්පන්න ගමනක ඉන්නේ. ඒ නිසා අපි මේ සභාවේ විශේෂයෙන් ඉදිරි කාලය තුළ මේ සභාවේ අවසාන වර්ෂයේ අපි අපේ ඊළඟ සැළසුම් සාකච්ඡා කරන කාලය එන්නේ. ඒ නිසා අපි ඒ ගමන් සියල්ලම ගැන කල්පනා කරලා අපි දෙපාර්ශවයම එකඟතාවයකින් මේ ගරු සභාවේ වැඩ කටයුතු කරන ලෙස ඉතා ගෞරවයෙන් ඒ සඳහා කටයුතු කරන ලෙස මම ඔබතුමාගෙනුත් ඉල්ලා සිටිනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------

බොහොම ස්තුතියි ! ප්‍රධාන ඇමතිතුමාට. අවුරුදු හතරක් පමණ අපි බොහොම සමඟියෙන් මේ සභාව කරගෙන ගියා. ඒ නිසා මේ සියළුදෙනාගේ සහයෝගයත් එක්ක යන්න කියලා තමයි එතුමා ඉල්ලා සිටින්නේ. පොල්ගම්පල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල***
***கௌரவ உறுப்பினர் ரஞ்சித் பொல்கம்பொல***
*Hon.Member Ranjith Pollgampola*
---------------------------------------------------------

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමතිතුමනි, ගරු අමාත්‍යවරුනි, ජනවාරි 08 වෙනිදා ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා දැරණියගලට පැමිණි අවස්ථාවක අපි භාරයක් වුනා එතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන්. ඒ භාරය ඔප්පු කරන්න ගරු අතුල ඇමතිතුමනි, ජනාධිපතිතුමා හම්බ වෙන්න ගියා දිනයක් ගන්න. එතනදී එතුමා ලබන මාසේ 11 වෙනිදා දැරණියගලට එනවා ඒ භාරය ඔප්පු කරන්න, පත්තිනි දේවාලයට. ඒ අවස්ථාවේ පළාත් සභාවේ බස් දුවන පාරවල් තුනක් ගරු සභාපතිතුමනි, ඉතාම අබලන් තත්ත්වයේ තියෙන්නේ. ඒ වෙලාවේ මම ඉල්ලීමක් කළා ඒ පාරවල් තුනත් හදලා දෙන්න කියලා. එතකොට ජනාධිපතිතුමා කිව්වා අතුල ඇමතිතුමාට කියන්න කියලා. ඒ ලිපියක් ඔබතුමාට ලබාදුන්නා. මම ඒ ලිපිය ලබාදෙන්නම්. 29 වෙනිදාට ඉස්සෙල්ලා පුළුවන් ආකාරයෙන් මේ පාරවල් හදලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------

ඒ ලිපිය සභාගත කරන්නත් අවස්ථාව දෙනවා. නමුත් ඒ වෙලාවේම දෙවියන්ට පඬුරක් ගැට ගහලා ආවා නම් හරිනේ පාර හදන්න.

ඊළඟට ශෝක ප්‍රකාශ යටතේ මේ අවස්ථාවේ අසෝක ජයවර්ධන අපේ සභානායකතුමාට අදහසක් පැහැදිලි

කරන්න තියනවා කියලා කිව්වා. ඒ සඳහා අවස්ථාව.

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, හැන්සාඩ් වාර්තාවේ සඳහන් කරුණක් නිවැරදි කර ගැනීමට. ගරු සභාපතිතුමනි, පහුගිය ගරු සුරංගනී එල්ලාවල මැතිණියගේ ශෝකය ප්‍රකාශ කරන දවසේ මගේ ශෝක ප්‍රකාශය අවසානයේ හැන්සාඩ් වාර්තාවේ සඳහන් වෙලා තියන වරදක් නිවැරදි කර ගැනීමටයි මගේ ශෝකය ප්‍රකාශ කරන්නේ. මට මේක නිවැරදි කරගන්න තිබුණා ලේකම්තුමාට කථා කරලා හැන්සාඩ් කණ්ඩායමට කථා කරලා නිවැරදි කරගන්න තිබුණා, මේ නිළ වාර්තාව නිකුත් වෙලා නොතිබුණා නම්. දැන් නිකුත් වෙලා නිසා තමයි මම මෙසේ සඳහන් කරන්නේ කියලා සඳහන් කරන්න ඕන. එකේ සඳහන් වෙනවා එතුමිය ඇසුරු කරපු සියළුදෙනාගේ ශෝකය, දේශපාලනය කරපු අප සියළුදෙනාගේ ශෝකය ඇය වෙත දන්වා යවන ලෙස ඉල්ලා සිටිමින් එතුමියට නිවන් සුව අත්වේවා ! කියා මා ප්‍රාර්ථනා කරනවා කියලා සඳහන් වෙලා තියනවා. ඒ නිසා මම ශෝකය ප්‍රකාශ කරමින් මම කියනවා එතුමියගේ පවුලේ අය වෙත කියලා තමයි මම කිව්වේ. ඒක වැරදීමක්. ඒක නිසා කරුණාකරලා ඒක සඳහන් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-----------------------------------------------------

ඔව්, ඒකේ වැරැද්දක් වෙලා තියනවා. බොහොම ස්තූතියි ඒක පෙන්වා දීම සම්බන්ධයෙන්.

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*
-----------------------------------------------------

ඒක ගරු සභාපතිතුමනි, බැරි වෙලාවත් මන්ත්‍රීවරයෙක් අතින් එහෙම කියවෙලා තිබුණා නම් ඒ වුනත් ඒක හදලා තමයි දාන්න ඕන.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-----------------------------------------------------

බොහොම ස්තූතියි ගරු සංවිධායකතුමනි. ඒක නිවැරදි කරලා යැවීමට අවශ්‍ය කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**පොදු කටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය නොවන යෝජනා:**

මේ යටතේ කිසිවක් නොමැත.

**පොදු කටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය යෝජනා:**

මේ යටතේ කිසිවක් නොමැත.

**පළාත් සභාවේ පොදු කටයුතු:**

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධනය සඳහා වන පනත් කෙටුම්පත සභාවට ඉදිරිපත් කරනවා. ඒ සඳහා තමුන්නාන්සේලාගේ අනුමැතිය බලාපොරොත්තු වෙනවා.

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි අපේ පනත් කෙටුම්පත සභාවට ඉදිරිපත් කරලා අනුමැතිය ගන්නා අවස්ථාව. පනත් කෙටුම්පත සභාවට ඉදිරිපත් කරලා තියෙනවා. ඒක සභා සම්මත කර ගැනීමේ අවස්ථාව.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon.Chief Minister Mahipala Herath*
------------------------------------------

අපි ඒක මුලින්ම ඉදිරිපත් කළා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------------------------------

නෑ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒක ආපහු සභාවේ පොදු කටයුතු යටතේ තමයි

ගන්න තියෙන්නේ. සභා සම්මත කර ගන්න.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon.Chief Minister Mahipala Herath*
------------------------------------------

සභාගත කරලා සම්මත කිරීමට මම ඉල්ලීමක් කළා. ඔබතුමා ඉදිරිපත් කරන්න.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------------------------------

ඔව් සභාවේ ඉල්ලීමක් කළා. දැන සභා සම්මත කර ගැනීමේ අවස්ථාව ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. සභාවේ ඒක මතිකව සම්මත වුණා සේ සලකනවා.

බොහොම ස්තූතියි සියළු දෙනාටම.

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු:**

අනුර අලගියවන්න මැතිතුමා.

**සභාව කල් තැබීම:**

ගරු සභානායකතුමා.

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි මෙම ගරු සභාව 2016 නොවැම්බර් 08 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස මම යෝජනා කරනවා.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා:**

***ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල***
**கௌரவ சிரில் பல்லேபொல**
*Hon.Member Cyril Pallepola*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි,ගරු අමාත්‍යවරුනි, පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුනි පළමුව මම ඉල්ලා සිටිනවා මගේ මේ ආසුනේ ප්‍රශ්න වාගයක් තියෙනවා. මම මීට ඉස්සෙල්ලාත් කියලා තිබුණා. ඒ නිසා මට රත්නායක මන්ත්‍රීතුමාගේ ආසනයේ ඉඳලා කතා කරන්න අවසර දෙන්න කියලා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි මම අවස්ථාවක් කර ගන්නේ 2016 සමස්ත ලංකා පාසැල් ක්‍රීඩා උත්සවයේ 17 පහළ උස පැනීමේ ඉසව්වෙන් දෙවෙනි ස්ථානය ලබා ගත් උමේසා රවින්ද්‍ර ජයලත් සිසුවාට සුභ පතන්න. ගරු සභාපතිතුමනි කෑගලු දිස්ත්‍රික්කයට දැදිගම ආසනයට කෑගලු දිස්ත්‍රික්කයේ දැදිගම කිවුල්දෙනිය මහා මායා විද්‍යාලයට කීර්තියක් ලබා දුන්නු මේ සිසුවා මම ඉපදුණ ගමේ මම පාසැල් ගිය පාසැලේ මම ජීවත් වුණු ගමේ දැදිගම පැරකුම්බා මහා විද්‍යාලයට කෑගල්ල මහා විද්‍යාලයට ගිහිල්ලා පුහුණුව ලබලා අද දරුවා මුළු සබරගමු පළාතේම කීර්තියක් ලබා දුන්නු දරුවෙක් හැටියට මම බොහොම ආඩම්බරයෙන් සිහිපත් කරනවා. ඒ දරුවාට මම සුභ පතනවා. ඒ විතරක් නෙමෙයි සබරගමු පළාත් සභාවේම සුභ පැතුම් පනිවිඩය මම ඒ දරුවාට දෙනවා. අද මේ දරුවාට මේ ක්‍රීඩාව කරන අවස්ථාවේ 12 වසරේ ඉගෙන ගන්නේ. අධ්‍යාපන කටයුතු කරන්න වෙනවා. නමුත් මේ පහසුකම් නැතුව මේ දරුවා කෑගල්ලට යන කොට මේ උසස් පෙළ අධ්‍යාපනයට පෙනී සිටින්න විභාගයට ලියන්න ඉන්නේ. මම මේ අවස්ථාවේ විෂය භාර අමාත්‍යවරයා හැටියට අපේ අධ්‍යාපන ඇමතිතුමාටත් මම යොමු කරනවා මේ දරුවා එහේ මෙහේ පාසැල් වලට ගිහිල්ලා පුහුණුවීම් කටයුතු ලබන්නේ නැතුව මේ පාසැලේ ඉඳගෙන ඒ දරුවාට ක්‍රීඩා කරන්න අවශ්‍ය මෙට්ටය,අවශ්‍ය ඇඳුම් පැළඳුම් අපිට දෙන්නට පුළුවන් සහයෝගය දෙන්නට කියලා. විශේෂයෙන්ම මම අ යන්න කියපු පාසැල. මම ඉගෙන ගත්ත පාසැල. ගමේ දරුවෙක් හැටියට මම බොහොම සතුටු වෙනවා. ඒ පාසැලේ ඉගෙන ගත්ත නිසා තමයි ඒ ප්‍රදේශය වෙනුවෙන් දැදිගම ආසනය වෙනුවෙන් කෑගලු දිස්ත්‍රික්කය වෙනුවෙන් සබරගමු පළාත් සභාවේ කතා කරන්නේ. ගරු සභාපතිතුමනි මේවා මහජන නියෝජිතවරු හැටියට අපිට හැමෝටම සබරගමු පළාත් සභාවට මේවා අපි කතා කරන්නේ අපිට එන්න පුළුවන්කමක් නෑ. අපි මහජන නියෝජිතවරු හැටියට මන්ත්‍රීවරු ඉන්නවා විපක්ෂයේ මන්ත්‍රීවරු අට දෙනෙකුත් අපේ පක්ෂයේ හය දෙනෙකුත්

මේ දරුවා උස පනින්නට ගියේ නුවර බෝගම්බර පිටියේ. මේ දරුවාට උස පනින්නට පුහුණු වෙන්නට පාසැලක් තිබුණේ නෑ. මේ පාසැලේ පුහුණුවීම් කටයුතු කරන්න අවශ්‍ය මෙට්ට තිබුණේ නෑ. ක්‍රීඩාපිටිය තිබුණේ නෑ. මේ දරුවා

14 දෙනෙක් ඉන්නවා. මේවා අපි කරන්නට ඕනේ. ඒ විතරක් නෙමෙයි ඒ විතරක් නෙමෙයි ගරු සභාපතිතුමනි දැදිගම ආසනය ගත්තහම පහේ ශිෂ්‍යත්වයෙන් තුන් වෙනි ස්ථානය ගත්ත දරුවා ඉන්නේ දැදිගම ඉස්කෝලයේ. ගිය සැරේ පහේ ශිෂ්‍යත්වයෙන් 2015 වසරේ

පළවෙනි ස්ථානය දිනා ගත්ත දරුවා කණිෂ්ඨ . අපි දැදිගම ආසනයේ බොහොම සතුටු වෙනවා මේවගේ දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්, අධ්‍යාපනයේ දරුවන් බිහිවීම. ඒ විතරක් නෙමෙයි සුසන්තිකා බිහි වුණෙත් දැදිගම ආසනයේ කියන එක මම මේ අවස්ථාවේ බොහොම නිහතමානීව සිහිපත් කරනවා. එහෙම නම් ගරු ප්‍රධාන ඇමතිතුමනි,ගරු අධ්‍යාපන ඇමතිතුමනි ඒ දරුවාට විශේෂයෙන්ම ඒ දරුවාගේ පවුලේ අයට සබරගමු පළාත් සභාවේ සුභ පැතුම් පනිවිඩයක් ඇරලා ඒ දරුවාගේ දෙමව්පියන්ට, ඒ ගුරු මණ්ඩලයට ක්‍රීඩා උපදේශකතුමියට ඒ දැනුවත් කරන පනිවිඩය දෙන්න කියලා ඉල්ලමින් ඒ දරුවාට සබරගමු පළාත් සභාවේ සහ මගේ සුභ පැතුම මේ අවස්ථාවේදී යොමු කරමින් ඒ දරුවාට හොඳ අනාගතයක් හොඳ ගමනක් යන්නට ශක්තිය,ධෛර්‍ය,වාසනාව ලැබේවා යැයි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය***
***கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய***
*Hon. Minister Bhanu Munipriya*

--------------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපි මෙවර ජාතික පාසැල් මළල ක්‍රීඩා තරඟයේ තුන් වෙනි ස්ථානය. ගිය අවුරුද්දේත් තුන් වෙනි ස්ථානය. අපි ස්ථානය රැක ගෙන තිබෙනවා. හැබැයි ඊට ඉස්සෙල්ලා අවුරුද්දේ අපි දෙවෙනි ස්ථානය. මේ දෙවෙන ස්ථානය සහ තුනවෙනි ස්ථානය අතර තියෙන්නේ ලකුණු දෙකක, තුනක පරතරයක්. එම නිසා මෙවැනි දරුවෝ අපිට ඉතාම වටිනවා. අපි සෑම වසරකම ගිය අවුරුද්දේ ඉඳන් මළල ක්‍රීඩා තරඟය ජාතික තරඟය පළාත් තරඟාවලියේ විශිෂ්ඨ දක්ෂතා වාර්තා තියන දරුවෝ ගෙනල්ලා වර්ණ ප්‍රදානයක් කරනවා. එතකොට ඒ වර්ණ ප්‍රදානය කරන අතර ඒ දරුවන් ගැන බලලා මේ දරුවා ක්‍රීඩා පාසැලකට ඇතුළත් කිරීම තමයි හොඳම. ඔබතුමා කියනවා ඒ පාසැලට දෙන්න කියලා ඒක ප්‍රශ්නයක් නෑ. හැබැයි ක්‍රීඩා පාසැල ළඟම ක්‍රීඩා පාසැලට ඇතුළත් කිරීම තමයි අපි කරන්නේ. ඒකෙන් විශිෂ්ඨ ගණයේ ක්‍රීඩකයන් බිහි වෙනවා. විශිෂ්සය ගණයේ දරුවන් පාසැල ඇතුළේ ඉන්න නිසා. එම නිසා පොල්ගම්පොල මැතිතුමාගේ යෝජනාව මම ඉතාම ගෞරවයෙන් පිළිගන්නවා. ඉදුනිල් ගරු මන්ත්‍රීතුමා කියපු පහේ ශිෂ්‍යත්වය ඒ දරුවා සම්බන්ධයෙන් ශිෂ්‍යත්වයක් ලබාදීම ඒ කාරණා සම්බන්ධයෙන් පොදුවේ අපි කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. එහිදී මේ සම්බන්ධයෙන් අපි කටයුතු කරනවා.

ඒවගේම මම කියන්න අවශ්‍යයි. ගරු විපක්ෂනායවකුමා ළඟම පාසැල හොඳම පාසැල සම්බන්ධයෙන් මම ඒකට පිළිතුරු එව්වා. ළඟම පාසැල හොඳම පාසැල කියන ව්‍යාපෘතිය එක්දාස් ගාණක් තියෙනවා. මිලියන හාරදාස් හත්සීයක් සබරගමු පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් වෙලා තිබෙනවා. මේවේ වැඩ පටන් ගනිමින් තිබෙනවා. මේවේ දැන්වීම් කරලා කොන්ත්‍රාත්කරුවෝ නම් කරලා ඒවේ වැඩ පටන් ගනිමින් තිබෙනවා පාසැල්වල. ඔබගේ මැතිවරණ කොට්ඨාශවල තිබෙන යෝජනා ටික අපි ඔබට දැනුවත් කරලා තිබෙනවා. ඒ අනුව ඒවේ ප්‍රගතිය බලා ගන්න පුළුවන්. ඒ ප්‍රගතිය සම්බන්ධයෙන් සමාලෝචන රැස්වීම අපි මාස එක හමාරකට සැරයක් රැස් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අපි මන්ත්‍රීවරුන් සියළු දෙනාට කැඳවන්න. ඒවගේම අද අධ්‍යාපන කාරක සභාව තිබෙනවා. ඒ කාරක සභාවේදී අනිත් සියළුම කාරණා ගැන ඔබගේ ප්‍රශ්න තිබෙනවා නම් සාකච්ඡා කරන්න අවස්ථාව තිබෙනවා. බොහොම ස්තූතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතියි ගරු අමාත්‍යතුමනි. ඒවගේම මම අර කිවුල්දෙනිය විද්‍යාලයේ උස පැනීමෙන් සමස්ත ලංකා දෙවෙනි තැනට පත් වෙච්චි ක්‍රීඩකයා විශේෂයෙන් පාසැල් ක්‍රීඩා වලින් ඉදිරියට ඇවිල්ලා ඉතාමත් අඩු පහසුකම් ඊයේ ඉස්කෝලයට ගිහිල්ලා උපහාර උත්සවයක් තිබ්බා ඒ දරුවාට. ඉතාම අඩු පහසුකම්. උස පනින්න මෙට්ටයක් නෑ. ලී කුඩු වලට තමයි පනින්න මුලින්ම පුහුණු වෙලා තියෙන්නේ. අන්තිම සතියේ තමයි ඔහු දැදිගම විද්‍යාලයට සහ කෑගලු විද්‍යාලයට එක්කරගෙන ගිහිල්ලා ඒ පුහුණුවීම් මූලික පුහුණුවීම් ටික ලබා ගෙන තියෙන්නේ. එතකොට ලී කණු දෙකකට ලණු දෙකක් බැඳලා තමයි ඒ පාසැලේ කිවුල්දෙනිය විද්‍යාලයේ පුරුදු වුණේ. ඒවගේම ඒ ක්‍රීඩා ගුරුවරිය ලොකු ශක්තියක් වෙලා තියෙනවා ඒ දරුවා ඉදිරියට ගේන්න. ඒ පිළිබඳව අපි සතුටු වෙන්න ඕනේ. ස්තූතිවන්ත වෙන්න ඕනේ. ඔහුට සුභ පතනවා වගේම ,ඔහුට සුභ පතලා පළාත් සභාවේ ඒ යෝජනාව පල්ලේපොල මන්ත්‍රීතුමාගේත් මගේත් සුභ පැතුම් එකතු කරන්න කියලා කියනවා. ඒවගේම ඒ පාසැලේ ඒ දරුවා ක්‍රීඩා පාසැලට ඇතුළත් කළා තෝලන්ගමුව විද්‍යාලයේ. ක්‍රීඩා පාසැලේ ඇතුළත් කලාට ඔහු ක්‍රීඩා පාසැලේ රැඳුණේ නෑ. ඔහු එතන තියෙන අපහසුතා නිසා ඔහු හිටපු විද්‍යාලයටම කිවුල්දෙනිය මධ්‍ය මහා විද්‍යාලයටම ආපසු ආවා. ඒ තෝලන්ගමුව විද්‍යාලයේ කෑගලු දිස්ත්‍රික්කයේම තියෙන එකම ක්‍රීඩා පාසැල. නමුත් ක්‍රීඩාපිටිය නෑ. ක්‍රීඩාපිටිය සංවර්ධනය කරනවා. තොලන්ගමුවේ ක්‍රීඩා පාසැලේ ළමයි එක්කෝ මීරිගමට යනවා. ක්‍රීඩා පුහුණුවට. නැත්නම් තවත් දිස්ත්‍රික්කයෙන් පිට තැන්වලට තමයි ක්‍රීඩා පුහුණුවට යන්නේ. මෙසේ අපහසුතා මධ්‍යයේ මෙසේ පාසැල් දරුවන් ලොකු කීර්තියක් අපේ පළාතටම කීර්තියක් ලබා දුන්නු ශිෂ්‍යයෙක් ඒ නිසා මේ ගැන සොයා බැලීමක් කරලා ඔහු ඉදිරියට ගැනීම අවශ්‍යයි කියලා මම ප්‍රකාශ කරනවා. ඒවගේම අපේ ඇමතිතුමාගේත් අමාත්‍යාංශ ලේකම්තුමාගේත් අවධානයට යොමු කරනවා. මීළඟට අකිල සාලිය එල්ලාවල මන්ත්‍රීතුමාට මම ආරාධනා කරනවා.

***ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.***
***கௌரவ உறுப்பினர் அகில எல்லாவல***
*Hon. Member Akila Ellawala*

---

ගරු සභාපතිතුමනි මෙවර ශිෂ්‍යත්ව විභාගයෙන් බලංගොඩ අධ්‍යාපන කලාපය විශිෂ්ඨ ජයග්‍රහනයක් අත් කර ගෙන තිබෙනවා. මුළු ලංකාවෙන්ම හත් වෙනි ස්ථානයටත් සබරගමු පළාතේ පළවෙනි ස්ථානයටත් ප්‍රතිශතයක් වශයෙන් 13.6% ක් වශයෙන් හා සංඛ්‍යාවක් ලෙස 456 ක් දරුවෝ සමත් වෙලා තියෙනවා. ගිය අවුරුද්දට වඩා ශිෂ්‍යන් 71 ක් වැඩි වෙලා තියෙනවා මේ පාර. ඒ නිසා මම අවස්ථාවක් කර ගන්නවා බලංගොඩ අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යක්ෂකතුමා ඇතුළු විදුහල්පතිවරු, කොට්ඨාශ අධ්‍යක්ෂකවරුන් , සියළුම ගුරු උපදේශකවරුන්ට සහ සියළුම ගුරුවරියන්ට සහ ඒ දක්ෂතාවය දක්වපු සියළුම දරුවන්ට මගේ සුභාශිංෂණ ඉදිරිපත් කිරීමට. බොහොම ස්තූතියි.

***ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය***
***கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய***

*Hon. Minister Bhanu Munipriya*

---

ගරු සභාපතිතුමනි මට පහේ ශිෂ්‍යත්වයෙන් සමත් දරුවා සම්බන්ධයෙන් අපේ අකිල එල්ලාවල මන්ත්‍රීතුමා කියාපු කාරණාවට ටිකක් එහාට ගිහිල්ලා කියන්න අවශ්‍යයි. සබරගමු පළාත පහේ ශිෂ්‍යත්වය සඳහා පහුගිය අවුරුදු තුනේම පළවෙනි ස්ථානය රැකගෙන ආවා. මෙවර සීයක් අපේ පහේ ශිෂ්‍යත්වයට ගියා නම් පහේ ශිෂ්‍යත්වලාභීන් ආධාර ලැබෙන්නේ පහළොස්දාහයි. සමත් වන්නන්ගේ ප්‍රමාණය තව වැඩි වෙනවා. ඒ අය අතර යම් පළාතක් වැඩියෙන්ම ශිෂ්‍ය ප්‍රමාණයක් සමත් කර ගත්ත පළාත මෙවරත් සබරගමුව පළාත් සභාව ලෙස නම් වෙනවා. 11.9% ක් සබරගමු පළාතේ ශිෂ්‍යයෝ පහේ ශිෂ්‍යත්වය සමත් වෙලා ලංකාවේ එක ලබාගෙන තිබෙනවා. එය ඔබට මේ ගෞරවයක් වශයෙන් දරුවන්ට ඒ අධ්‍යක්ෂකවරුන්ට ලේකම්තුමාට අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂකතුමා පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ,කලාප අධ්‍යක්ෂකවරු ,අනිකුත් විෂය අධ්‍යක්ෂකවරු, විදුහල්පතිවරු ,ගුරුවරු සහ සියළු දෙනාටම මේ අවස්ථාවේදී මගේ ගෞරවය ස්තූතිය පුද කරනවා. සබරගමු පළාත් සභාවේ අධ්‍යාපන ඇමතිවරයා වශයෙන්. බොහොම ස්තූතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතියි ගරු භාණු මුණිප්‍රිය ඇමතිතුමනි. මීළගට විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---

ගරු සභාපතිතුමනි මගේ පළවෙනි ප්‍රශ්නය ඇහැලියගොඩ රෝහලේ ගිලන් රථය අනතුරකට පත්වීම සම්බන්ධව මම ඔබතුමාගෙන් ප්‍රශ්න අටක් අහලා තියෙනවා. ඒකට මට උත්තර ලැබුණේ නෑ. දෙවෙනි කාරණය ගරු අතුල කුමාර රාහුබද්ධ ඇමතිතුමනි. ඔබතුමාගේ විෂය. ලියා ගත්ත එකත් පේන්නේ නෑ. ලියා ගත්තේ නැති ටික දාන්නම් ඉස්සෙල්ලා. පළාත් මාර්ග පාරක් වශයෙන් ගරු ඇමතිතුමනි ඔබතුමා මේක නිතරම කියනවා කියලා මොකුත් හිතන්න එපා. මම මේ ඊයේත් ගිහිල්ලා ආවේ ගරු ඇමතිතුමනි. ඔබතතුමාට මම කින්නේ මේ පළාත් සභාවේ විෂයභාර ඇමතිවරයා වශයෙන්. හපුගහහේන කියන තැන සිරි සමන්පුර පාර බෝඩ් එකක් ගහලා තියෙනවා තොපේ අම්මලාට කියලා. මම ඉතුරු ටික කියන්නේ නෑ. ඒ කියන්නේ පක්ෂ විපක්ෂ ඔක්කෝටම. මොකද වාහනයක් කැඩිලා අනිත් පැත්ත කැඩිලා. අර ගල් ගොඩ ගොඩගැහිලා ඉවර වෙලා ඒ පාර හදපු පාරක් ගරු ඇමතිතුමනි ඔබතුමා දන්නවා. අයිරෝඩ් එක හරහා හදාපු එක. මම මේ සභාවේ කිව්වා අඩි දහයක් පළලයි කාපට් එක. අඩි 8 ක් පළලයි කොන්ක්‍රීට් එක. මේක නවත්තනවා. දැන් අපි යන කොට අඩි දෙක හරියන්න කොන්ක්‍රීට් එක කෙලින්ම කාපට් එක යනවා. පිස්සෝ කරපු වැඩක්. දැන් කොන්ක්‍රීට් කරපු එක කාපට් දාන්නේ නැනේ. එතකොට දැන් සම්පූර්ණම කොන්ක්‍රීට් එක කැඩිලා. යන්නම බෑ. පාර දෙපැත්තත් කැඩිලා. මේකේ කාපට් එකේ ඝණකම ගත්තහම ගරු ඇමතිතුමනි අඟල් එක හමාරක්වත් නැති තැන් තියෙනවා. විශේෂයෙන්ම අර හපුගහහේන කියන කඳු ගැටේ එතන තමයි තොපේ අම්මලාට කියලා ගහලා තියෙන්නේ. මම ඉතුරු ටික කියන්නේ

නෑ. ඒ කියන්නේ පක්ෂ විපක්ෂ ඔක්කෝටම ගහලා තියෙන ගැහිල්ලක් ඒක. මම ඒ බෝඩ් එක ගලෝගෙන ආවා. මොකද මට වැදුණත් එකයි ආණ්ඩු පක්ෂයේ තමුන්නාන්සේලාට වැදුණත් එකයි. මොකද මම කියලා ආවා එතනින් මම බෝඩ් එකක් ගහලා ආවා සති තුනක් ඇතුළත පළාත් සභාවේ ගරු ඇමතිතුමා කියලා මේ පාර හදනවා කියලා බෝඩ් එකක් ගහලා ආවා. මොකද සභාවේ අවුරුදු තුනක් කතා කරනවා මේක. එතකොට ගරු ඇමතිතුමනි සභාපතිතුමනි මම කියන්නේ මේ ඇමතිතුමාට ගහන්න නෙමෙයි. මේ පාර කොහොම හරි හදා ගන්න. බස් එක දවසට තුන් හතර පාරක් කැඩෙනවා. පාර හදාපු නැති තැන් තියෙනවා. බෝක්කු තුනක් තියෙනවා. සම්පූර්ණම පාරට තිස්එක් කෝටියක් කියලා කියනවා. මගේ හිතේ කෝටි අටකවත් වැඩ කෙරිලා නෑ. ඒවගේ පුදුම ගසා කෑමක් එතන තියෙන්නේ. ඒ නිසා තමුන්නාන්සේගේ අවධානය විශේෂ යෙන්ම යොමු කරන්න. මාත් එක්ක අමනාප වෙන්නේ නැතේ තමුන්නාන්සේ මතක් කරලා දුන්නට.

ඒවාගේම තමයි අනිත් පාර. ලක්ෂ 14 ක් දීලා පළාත් සභාවෙන් හැදුවා ගරු ඇමතිතුමනි. පත්බේරිය වසම බැවිල සමගිපුර පාලම. එගොඩ තියෙනවා අක්කර 2000 කට වැඩිය ගරු සභාපතිතුමනි. ඒවේ තේ දළු ,රබර් ගේන පාලම. මේ පාලම හදලා හරියටම අවුරුදු දෙකෙන් කඩාගෙන වැටුණා ගරු ඇමතිතුමනි. කැඩුණට පස්සේ මම මේ සභාවේත් කීප වතාවක් කිව්වා. පරීක්ෂණයක් කරනවා කිව්වා. මම දන්නේ නෑ පරීක්ෂණය. බැරි තැන වසමට වෙන් වෙන ලක්ෂ දහයෙන් ලක්ෂ පහක්ම මම දුන්නා මේක ප්‍රතිසංස්කරණය කර ගන්න කියලා. එතෙන්ට කාර්මික නිළධාරී ඇවිල්ලා කියලා තියෙනවා මේක ලක්ෂ පහෙන් කරන්න බෑ ලක්ෂ 17 ක් යනවා කියලා. ඉතිං අපි සම්පූර්ණයෙන්ම පාලම හැදුවේ ලක්ෂ 14 න්. දැන් කාර්මික නිළධාරයා ලක්ෂ 17 ක් යනවා කියලා කියන කොට ග්‍රාම සේවක මොකක්ද කෙරුවේ අර හිගන්නාගේ පාත්තරයට ගහන්නා වගේ අර ලක්ෂ පහ එයාගේ වෙනත් වැඩකට දීලා. මම කිව්වා දේශපාලන අධිකාරිය ඕනේ නෑ අපේ සල්ලි වියදම් කරන්න කියලා. ග්‍රාම සේවකට දෙන්න බෑ. නමුත් එයා පුළුවන් දෙයක් කරන්න කියලා වෙනත් දේකට යොදවලා තියෙනවා. ඉතිං ගරු ඇමතිතුමනි මම ඔබතුමාව එක්කරගෙන යන්නම්. යන්න බෑ මෙතනින්. එතකොට ඒදණ්ඩක් දාලා තියෙනවා ඒ ඒදණ්ඩෙන් යන්න වෙන්නේ එක්කෙනාටයි. තේ දළු මිටියත් අරගන එනකොට ඒදණ්ඩෙන් දෙයියන්ගේ පිහිටයි. ඒ නිසා මේකට ලක්ෂ 14 ක් යනවා කියලා කියන්නේ කාර්මික නිළධාරී කියලා තියෙනවා ලක්ෂ 17 ක් ආයේ යනවා කියලා. කරුණාකරලා මේ පාලම අක්කර 2000 කට වැඩිය හෝග තේ දළු අරවා මේවා ගේන ඒක නැවතිලා තියෙනවා . මේක තමුන්නාන්සේ විශේෂයෙන්ම අවධානයට ගන්න. බැවිල සමගිපුර පාර. ඒවගේම ගරු ඇමතිතුමනි තරහ වෙන්නට එපා මේ ඇත්තෙන්ම මම මේ මිනිස්සුන්ගේ අදෝනාව කියන්නේ. අපේ බදුවත්තෙන් යන පාර ගත්තහම මෙච්චර කල් කිව්වා ඒකට දැන් ගමේ මිනිස්සු මොකද කරන්නේ ලෑස්ති වෙලා ගේ ගාවින් ගෙදරට වතුර විසි වෙන හින්දා . මිනිස්සුන්ට වතුර විසි වෙන හින්දා මේක ගරු සභාපතිතුමනි මිනිස්සු කොන්ක්‍රීට් දානවා. ඒක ප්‍රමිතියකට නැහැ. කාපට් පාරේ කොන්ක්‍රීට් දාන්න අයිතියක් නැහැ. මොකද ඒ මිනිස්සු පාරවල් හදා ගන්නයි ගහලා තියෙන්නේ. ඒ කොන්ක්‍රීට් දාපු වල එක වගේ දෙකක් වෙලා තියෙනවා. තැනින් තැන. ඒ නිසා විශේෂයෙන්ම තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න. මෙන්න මේ පාරවල් දෙකයි පාලමයි ගැන. අපි මෙහෙම කියන්නේ ජනතාවගේ ප්‍රශ්න. දැන් මම කිව්වේ ඇත්ත කතාව. දැන්

තමුන්නාන්සේට කියයි කට්ටිය. කපුගහහේන පාරේ බෝඩ් එකක් තිබුණා. තොපේ අම්මලාට කියලා . ඉතුරු හරිය මම මෙතන කියන්නේ නෑ. ඒත් ගලෝලා මම ගෙනාවා. අන්න ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹூபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*

-----------------------------------------------------

මේ පළාත් සභාවේ මේ මාර්ගය පිළිබඳව කතා කළා. මේක කෝටි ගණනාවක් කියලා කිව්වා. හදලා තියෙන්නේ යම් ප්‍රමාණයක් කියලා කිව්වා. මේක පළාත් සභාවට තමයි බැර වෙන්නේ නැත්නම් මාර්ග අමාත්‍යාංශයට තමයි චෝදනාව එල්ල වෙන්නේ. මම පුන පුනා අයවැය කතාවලදීත් ඔබතුමා නගන ප්‍රශ්න වලදීත් බොහොම පැහැදිලි උත්තරයක් දුන්නා. මේක මධ්‍යම ආණ්ඩුව විසින් අත්පත් කරගෙන කාපට් ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරලා ඉතාම අසාර්ථකයි. මම මේ ආණ්ඩුව නැති කාලයේත් කියන මනුස්සයෙක් නෙමෙයි. ආණ්ඩුව ඇති කාලයේත් මේක පිළිබඳව විවේචනයක් මගේ තිබුණා. ඒක බොහොම පැහැදිලිව

කිව්වා. අසාර්ථක ව්‍යාපෘතියක් විදිහට අසාර්ථක වුණා. ඒ නිසා ඔබතුමා එල්ල කරන චෝදනාව කාලාන්තරයක් තිස්සේ එනවා. ඒකට අපි වගකිවයුත්තෝ විදිහට මේ කාරණාව කරේ මධ්‍යම ආණ්ඩුව. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව. ඒවගේම මාර්ග සංවර්ධන අධිකාරිය එක්ක තමයි මේ සියල්ල සැලසුම් කළේ. එතකොට අපේ පළාත් මාර්ගයක් විදිහට ගත්තහමත් අපේ කිසිදු අනුමැතියක් අපේ පසුවිපරමක් ඒවගේම අපේ අධීක්ෂණයක් මේ මර්ග ඉංජිනේරු සංස්ථාව මගින්වත් නොකර තමයි මේ මාර්ග කළේ. ඒ නිසා අද වෙන

කොට ඔබතුමා කියන ඒ අවශ්‍යතාවය ඒ අපහසුතාවය සිද්ධ වෙලා තියෙනවා. ඒ සඳහා වර්තමාන රජයත් ප්‍රතිපාදන මේ වෙන කොට එවලා තියෙනවා. එදා කරගෙන ගිය කාපට් මාර්ග ටික යතාවත් කිරීම සඳහා ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් රත්නපුර දිස්ත්‍රික්කයටත් කෑගල්ලටත් වෙන වෙනම එවලා තියෙනවා. මේ වනවිට රත්නපුර දිසාපතිතුමා යටතේ පක්ෂ විපක්ෂ රත්නපුරේ නායක දෙපළත් එක්ක සාකච්ඡා පවත්තලා ඒ අනුමත වුණු පාරවල් සඳහා ප්‍රතිපාදන වෙන් කරලා තියෙන්නේ. ඒක දෙසැම්බර් වෙන කොට ටෙන්ඩර් දාලා අවශ්‍ය දේ සියළු දේ කරලා තියෙනවා. ඒකත් අපි විශ්වාස කරන්නේ නෑ ඔබතුමා හෙට දවස තුළත් ආපහු ඒ ආණ්ඩුවටමයි චෝදනාව ගේන්න සිද්ධ වෙන්නේ. හේතුව තමයි අර කරගෙන ගිය විදිහේම ඒකේ තියෙන අඩුපාඩු විතරයි. ඒකට අපි දකින දේ තමයි අපි ඉදිරිපත් කරන කාණු පද්ධතිය, ඒවගේම අවශ්‍ය තැන්වල පළල් නොවීම. මේ කාරණා හෙට දවසේත් අපිට කතා කරන්න සිද්ධ වෙයි. ඉතිං කොහොම වුණත් මේ ප්‍රශ්නය කාට දෝලනය වුණත් අවසාන වශයෙන් ප්‍රතිඵලය එන්නේ පළාත් සභාවට. අපි මෙතන හිටියත් නොහිටියත් එන එක්කෙනාටත් මේ ප්‍රශ්නය එනවා. මේ ප්‍රශ්නය අපි වගකිවයුත්තෝ නොවුණත් අපිට වගකීමක් තියෙනවා අපේ මාර්ගයක්

විදිහට . ඒක නිසා මේ වනවිට මේක සාර්ථක උත්තරයක් ලැබිලා තියෙනවා. අපි විශ්වාස කරනවා මේ දෙසැම්බර් 31 වෙන කොට ඒ සඳහා අදාල ඇස්තමේන්තු පත්තරේ දාලා තියෙනවා. ඒ ප්‍රදානය භාර ගනීවි. මේ අවශ්‍යතාවය ඉටු කරයි කියලා. හැබැයි ඔබතුමා කියපු පත්බේරිය පාලම පිළිබඳව අපෙන් ඉදිරිපත් වෙලා තියෙනවා නම් ඒ ඇස්තමේන්තුව ඔබතුමා කියපු විදිහට පරීක්ෂණයට ලක් කරලා තියෙනවා නම් මේ වනවිට පරීක්ෂණ වාර්තාව නැත්නම් ස්ථිරවම ලබන සභා වාරයට මේ පිළිබඳව පරීක්ෂණයක් කරලා මොකද වසර දෙකක් ඇතුළත පාලමක්

කැඩෙන්න බෑ. එහෙම නම් ඒක වෙනත් ස්වභාවික හේතු තියෙන්න ඕනේ. අධික වර්ෂාව හේතු කරගෙන පැති බැමි දෙක කැඩිලා යන්න ඕනේ. එහෙම නොවෙන්න සාධාරණ ප්‍රශ්නයක් මේක. අවශ්‍ය කරන උත්තරය ලැබිලා නැත්නම් ඉදිරි සභාවට ස්ථිර වශයෙන් ඔබතුමාට ඒ අවශ්‍ය කරන වාර්තාව ලබා දෙනවා.

අනිත් එක තමයි බදුවත්ත ප්‍රධාන පාර. ඒකටත් මම ඉහත කිව්ව කාරණාව සඳහාම වෙන් වෙලා තිබුණත් අපේ ඉංජිනේරු ආයතනයට ප්‍රතිපාදන වෙන් වෙලා තියෙනවා. කඩතොළු වෙලා තිබෙන ස්ථාන කාපට් කරන්න කොන්ක්‍රීට් කරන්න නෙමෙයි. ඒක ප්‍රායෝගික නෙමෙයි. ඒ නිසා එතුමන්ලාට කාලය අවශ්‍යයි කියලා කියනවා. ඒක හරියටම කපන්න ඕනේ. වල උඩින් දාලා බෑ. නිශ්චිත ප්‍රමාණයක් අයින් කරලා නැවතත් පොළොව හදලා ඒවගේම රස්නිය හොට් මිශ්වරය ගහන්න ඒ කියන්නේ රශ්නිය ගහලා තියෙන කාපට් එකම ගහන්න ඕනේ. අපේ අතින් ගහලා කෝලාස් එක අනලා හදන මිශ්‍රණය ප්‍රායෝගික වෙන්නේ නැති කාරණා දෙකක් නිසා එතුමන්ලා මං හිතන්නේ මේ වෙන කොටත් ඒ කාරණාව සඳහා කථිකාවතක් තියෙනවා. දෙසැම්බර් වෙන කොට හදනවා. ඒ නිසා මම විශ්වාස කරනවා අර බෝඩ් එක ඉතුරු ටික අපිට ගැහුවාට ප්‍රශ්නයක් නෑ. අපි ඒ ටිකත් කිව්වා නම් හොඳ මේ ටිකත් කිව්ව එකේ.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතියි ගරු අමාත්‍යතුමනි. මීළඟට ගරු නිහාල් ෆාරුක් ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*

---

ගරු සභාපතිතුමනි සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම යෝජනාව ඉදිරිපත් කරන්නේ පවතින කාලගුණ තත්ත්වය හේතුවෙන්. සබරගමු පළාතේ රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල ප්‍රදේශ කීපයක ජනතාව උග්‍ර ජල හිඟයකට මුහුණ පාලා සිටින නිසා ඒකට ස්ථිර විසඳුමක් හැටියට භූගත ජලය ලබාගැනීම සඳහා නළ ළිං වඩාත් සුදුසුයි කියලා මම යෝජනා කරනවා. පවතින කාලගුණය කියන්නේ වර්ෂාව නෙමෙයි. වියළි කාලගුණය දිගටම බලාපොරොතතු වෙන්න වෙනවා අපිට ඉදිරියේදී. ඒ නිසා අපේ පළාත තුළ උග්‍ර ජල ප්‍රශ්නයකට මුහුණ පාන්න සිද්ධ වෙනවා. ඒ නිසා ජනතාවට ස්ථිර විසඳුමක් හැටියට භූගත ජලය ලබාගැනීම සඳහා නළ ළිං ඉදිකිරීම මං හිතන්නේ සමාජ සුභසාධන අමාත්‍යාංශයටත් ප්‍රධාන අමාත්‍යාංශයටත් පුළුවන්කම තිබෙනවා. මේ පිළිබඳව සභාවේ අවධානය යොමු කරලා මින් ඉදිරියේදී මේකට ස්ථිර විසඳුමක් හැටියට නළ ළිං ඉදිකිරීම වඩාත් සුදුසුයි කියලා මේ ගරු සභාවට යෝජනා කරනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතියි ගරු මන්ත්‍රීතුමනි. නමුත් ජල සම්පත් මණ්ඩලය අපි දන්නවා පහුගිය කාලයේ නළ ළිං විශාල ප්‍රමාණයක් ඉදි කළා. ජලය ලබාදීම සඳහා. වරකාපොල ප්‍රදේශයේ ජල සම්පත් මණ්ඩලයෙන් නළ ළිං හදපු එහෙකවත් මේ වෙන කොට වතුර නෑ. එහෙම සාර්ථක ක්‍රමයක් නෙමෙයි ඒකත්. එක පාරට ගහන වෙලාවේ වතුර තියෙනවා. ආයේ නැති වෙනව. එහෙමත් තැනක තමයි වතුර තියෙන්නේ. අද දවසේ මම යෝජනාවක් ගේන්න හිටියේ. මම මූලාසනයේ ඉන්න වුණ නිසා යෝජනාවක් ගේන්න වුණේ නෑ. මම මේක විනාඩියක් ගන්නවා. අවස්ථාවක් කර ගන්නවා.

පහුගිය නියඟය නිසා පීඩාවට පත් වුණු ජනතාවට වතුර දෙන්න වතුර ගන්න තැනක් තිබුණේ නෑ. ජල සම්පත් මණ්ඩලය තමයි ජලය ගන්න තියෙන්නේ. නමුත් වරකාපොලෙන් ගන්න පුළුවන්කමක් තිබුණේ නෑ බවුසර වලට. ගලිගමුවෙන් ගන්න පුළුන්කමක් තිබුණේ නෑ. කෑගල්ලෙන් ගන්න පුළුවන්කමක් තිබුණේ නෑ. හිරිවඩුවෙන් ගන්න පුළුවන්කමක් තිබුණේ නෑ. එක තැනකවත් ඒ ජල සම්පත් මණ්ඩලයෙන් වතුර තිබුණේ නෑ. නමුත් අපිට වතුර ගන්න පුළුවන්කම ලැබුණේ තුල්හිරිය මාක්ස් ආයතනයෙන් විතරයි. ඒ මාක්ස් ආයතනයෙන් තමයි ජනතාවට වතුර බෙදලා දුන්නේ. ඒ පිළිබඳවත් මම පෞද්ගලිකව මේ පළාත් සභාවේ ස්තූතිය පුද කර සිටිනවා. ඒ නිසා ඒ මාක්ස් ආයතනයට ලිඛිතව මේ සම්බන්ධව අපි පළාත් සභාවේ ස්තූතිය පුද කරලා ලියුමක් යවන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මොකද වතුර දෙන්න තියෙන ආයතන එකක්වත් වතුර නැති වෙලාවක මාක්ස් ආයතනය තුළින් පෞද්ගලික ආයතනයක් හැටියට ඔවුන් ඉතාම පිරිසිදු වතුර ලබා දෙන්න කටයුතු කළා. ඒ පිළිබඳව සතුට,ස්තූතිය පුද කරනවා. බොහොම ස්තූතියි ගරු අමාත්‍යතුමන්ලා, සියළු ගරු මන්ත්‍රීතුමන්ලාට සභාව කරගෙන යාම සඳහා සියළු දෙනාගේම සහයෝගය ලබාදීම සම්බන්ධව. දැන් වේලාව පෙරවරු 11.18 යි. මෙම ගරු සභාව 2016 නොවැම්බර් මස 08 වෙනි දින පෙරුවරු 10.00 දක්වා කල් තබනවා.

අත්/කළේ :
කංචන ජයරත්න,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පාලිත නානායක්කාර,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2016 ක් වූ ඔක්තෝබර් මස 31 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.